# තනතුරු - ඇබෑර්තු
## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින "කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්" තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් **2023 ජූලි මස 07** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්" යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

**කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් තනතුර :**

1. වැටුප් පරිමාණය.- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 98,650 - 12 × 2,925 - රු. 133,750 /-වේ. (අනෙකුත් අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප

රු. 290,000.00 පමණ වේ).

2. වෙනත් ප්‍රතිලාභ :

(i) රියදුරු සමග නිල වාහනයක්,

(ii) විදේශ පුහුණු සඳහා අවස්ථාවන්.

3. වයස් සීමාව.- අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 40 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම්.- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයක් මගින් ලබා දෙන නීතිවේදී උපාධිධාරියෙකු වීම.

5. වෘත්තීය සුදුසුකම්.- ශ්‍රේෂ්ඨාධිකරණයේ අවම වසර 10ක ජ්‍යෙෂ්ඨත්වයක් සහිත නීතිඥයකු වීම.

6. පළපුරුද්ද.- රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක මානව සම්පත් කළමනාකරණ /රාජ්‍ය පරිපාලන /ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක වසර 10ක කළමනාකරණ පළපුරුද්ද.

පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ :

(අ) ව්‍යවස්ථාපිත නීතිය, පාර්ලිමේන්තුවේ කටයුතු සහ ක්‍රියාදාමයන් පිළිබඳ මනා දැනුමක් තිබීම,

(ආ) රජයේ පරිපාලන සහ මුදල් රෙගුලාසි පිළිබඳ මනා අවබෝධයක් තිබීම,

(ඇ) ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම,

(ඈ) තොරතුරු තාක්ෂණ කුසලතාවයන්,

(ඉ) අධිකරණ සේවයේ/ නීතිපති දෙපාර්තමේන්තුවේ පළපුරුද්දක් ලබා තිබීම,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ නිපුණතාවයක් තිබීම,

(උ) අංක 6 හි පළපුරුද්ද යටතේ දක්වා ඇති කුමන හෝ එක් අංශයක් සම්බන්ධයෙන් පශ්චාත් උපාධි සුදුසුකම්.

7. බඳවා ගැනීමේ ක්‍රමය.- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

8. සේවා නියමයන් හා කොන්දේසි :

(i)

ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අනුව මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය තීරණය කරනු ඇත. තෝරා ගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත් ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරු, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v)

ලබන අයදුම්කරු පත් කරනු ලැබීමට පෙර ඔහු පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

9. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,

(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,

(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

10. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

11. තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

12. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කුෂානි රෝහණදීර,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2023 ජූනි මස 21 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,